**ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(**2**) ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 සැප්තැම්බර් **14** දින ගණන්දීමේ නිලධාරීී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍යා වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණ | නිර්දේශය |
|---|---|---|
| 1.6.1 (ඈ) | දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 09 ක ක්‍රීඩාංගන සහ නේවාසිකාගාර ස්ථාපිත කර ඇති අතර මෙම වත්කම් ගිණුම් ගතකර නොතිබුණි. | මෙම වත්කම් අදාළ වත්කම් ලේඛනයන්හි ගිණුම් ගත කිරීමට ක්‍රියාකල යුතු වීම |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ඇස්තමේන්තු ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල දැක්වීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තක්සේරු වටිනාකම එකතුව රු. මිලියන 30 ක් වූ වාහන 05 ක් ස්ථාවර වත්කම් ලේඛණයේ ගිණුම්ගත නොකිරීම හා තක්සේරු වටිනාකම එකතුව රු. මිලියන 80 ක වාහන 08 ක් ස්ථාවර වත්කම් ලේඛණයේ රු.38 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වාහනවල වටිනාකම රු. මිලියන 72 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වෙමු.<br>2023 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත 2021 වර්ෂයේදී පවරා දී තිබූ රු. තිබූ 5.8 ක වටිනා අංක NC-4782 වාහනය ස්ථාවර වත්කම් ලේඛණයෙන් ඉවත් කර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වත්කම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමු.<br>2023 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | රු. මිලියන 1,234 ක් වූ වැඩ නිම කළ ව්‍යාපෘති 22 ක් සහ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිමකර වෙනත් රජයේ ආයතන හා පාසල්වලට භාරදී තිබූ රු. මිලියන 683 ක්වූ ව්‍යාපෘති 16 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන වැඩවල ඇතුළත් කර තිබීම හේතුවෙන් කෙරීගෙන වැඩ රු.මිලියන 1,917 කින් අධි තක්සේරු කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ඈ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 5ක සහ සියළු ක්‍රීඩා සංකීර්ණවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම 2022 දෙසැම්බර් 31 දින වන විට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වෙමු.<br>2023 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වීම. |

### 1.6.2 කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා අවස්ථා දෙකකදී ලබා දුන් අත්තිකාරම් මුදලින් පියවා තිබුණු රු. මිලියන 5.7 ක් සහ එම ශේෂවලට අදාල රු. 857,625 ක්වූ එකතු කළ අගයමත බදු මුදල සමාලෝචිත වර්ෂයේ පියවා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ශේෂයෙන් අඩු කර නොතිබීම හේතුවෙන් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා සංචිත ගිණුමේ ශේෂය එකතුව රු. මිලියන 6.6 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වෙමු.<br><br>2022 වර්ෂයේ අයකරගත් කුලී වැඩ අත්තිකාරම් ගිණුම් ශේෂ එම වර්ෂයේ ගිණුම් වලින් ඉවත් කිරීම මගහැරී තිබූ බැවින්, 2023 වර්ෂයේ මේ වන විට වරද නිවැරදි කර අත්තිකාරම් ශේෂ නිවැරදිව පවත්වා ගෙන යනු ලබන බව කාරුණිකව දන්වමි. | නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වූ අත්තිකාරම් “බී” ගිණුමට අනුව නිලධාරීන් දෙදෙනෙකුගේ හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.218,082 ක් වූ අතර එම ණය ශේෂ අතර වර්ෂ 9 ක් පැරණි සේවය අතහැර ගිය නිළධාරියකුගෙන් අයවිය යුතු රු. 35,600ක් සහ වර්ෂ 17 ක් පැරණි මිය ගිය නිළධාරියකුගෙන් අයවිය යුතු රු. 58,450ක ණය පැවතුණි. මිය ගිය නිළධාරියාගේ ණය ගොණුව ලේඛණාගාරයේ නොතිබීම හා සේවා කාලය අවුරුදු 05 සම්පූර්ණ නොවීම හේතුවෙන් එම ණය මුදල මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට ද නොහැකි වූ අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවද කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමු.<br><br>2021 වර්ෂයේ සිට අදාල ණය නිරවුල් කරන ලෙස අදාල පාර්ශව වෙත දැනුම් දුන්නද, මේවන තෙක් ණයපියවීමට අපොහොසත් වී ඇති බැවින් මු.රෙ 104ට අනුව පරික්ෂණ පවත්වා අදාල ණය ශේෂ කපාහැරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | ණය මුදල් අප්‍රමාදව අය කර ගැනීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. |

## 2.2 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 02 සිට 06 දක්වා පැවති රු. මිලියන 37.8 ක් සහ වර්ෂ 6 ට වඩා පැරණි රු.මිලියන 2 ක් වූ කොන්ත්‍රාත් තැන්පතු 72 ක් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට නිදහස් කර නොතිබුණි. | ඔබ විසින් පෙන්වාදී ඇති කොන්ත්‍රාත් තැන්පතු 120, වර්ෂ 02 ඉක්මවා ඇති නමුත් ව්‍යාපෘති සම්පූර්ණකර නොමැති නිසා තැම්පතු නිදහස් කර නොමැති බවත් කොන්ත්‍රාත් වැඩ නිමවූ පසු නිදහස් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වමි. | ඉදිකිරීම් කටයුතු අප්‍රමාදව සිදු කර තැන්පතු නිදහස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) තැන්පත් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 02 සිට 05 දක්වා හා වර්ෂ 5 ට වඩා පැරණි එකතුව රු. මිලියන 17.6 ක් වටිනා කොන්ත්‍රාත් තැන්පතු 42 ක් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල නඩත්තු කාල සීමාව ඉක්මවා තිබුණද අඩුපාඩු සකස්කර නොමැති වීම, නිරවුල් කිරීම සඳහා නිර්දේශ ලබා නොගැනීම හා අවසන් බිල්පත් ඉදිරිපත් නොවීම යනාදි හේතුන් මත රැඳවුම් මුදල් නිදහස් කර නොතිබුණි. | | නඩත්තු කාල සීමාව ඉක්මවා ඇති ව්‍යාපෘතිවල කඩිනමින් අඩුපාඩු සකස්කරවා ගෙන සහ අවශ්‍ය නිර්දේශ ලබාගෙන තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණයන් වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ | එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයක් වෙනුවෙන්ම ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු ඒ සී ඒ-2(ii) ආකෘතියෙහි දැක්විය යුතු වුවත් වැය විෂය සංකේතාංකයන් 07 ක් සඳහා ප්‍රතිපාදන ඉතිරියට හේතු දක්වා නොතිබුණි. | එකඟ වෙමු.<br>ඇතැම් වැය විෂයන් සඳහා හේතු ඉදිරිපත් කිරීමේදී අතපසුවීම් සිදුවී ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| | දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වැය විෂය සංකේතාංකයන් 2 ක් සඳහා ප්රතිපාදන ඉතිරි ප්‍රතිශතය දක්වා නොතිබුණි. | එකඟ වෙමු.<br>වැය විෂය සංකේතාංකයන් 2 ක් සඳහා ප්‍රතිපාදන ඉතිරි ප්‍රතිශතය අත්වැරදීමකින් දන්වා නොතිබුණි | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,140 ක් සහ 2022 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන 324ක් වූ පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 7 ක් | පෙර වර්ෂ වල සිට ඉදිරියට ගෙන එන ව්‍යාපෘති 7 ක් අත් හැර දැමීමට හේතු පහත සඳහන් වේ.<br>**ව්‍යාපෘතිය** — **අත්හැරදැමීමට හේතු හා දැනට තත්වය**<br>මොණරාගල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය — ප්‍රතිපාදන නොමැති බැවින් ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. | ආරම්භ කරන ලද ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නියමිත දිනට ඉදිකිරීම් සාර්ථකව නිමකළයුතු බව. |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදන නොමැති වීම, කොන්ත්‍රාත් හා උපදේශක ආයතන සමග ඇති වූ ගැටලුකාරී තත්වයන් යනාදි හේතුන් මත වැඩ නිම නොකර ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි. | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ අමතර වැඩ<br><br>මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ශක්ති වර්ධන ශාලාව සහමාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ අමතර වැඩ | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ඉදිකිරීම් සඳහා පවරා තිබූ අතර එම ආයතනය සමඟ ඇතිවූ ගැටළු සහගත තත්වය හේතුවෙන් ඉදිකිරීම් අතර මග නවතා දැමීම නිසා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අනුමැතිය ලබා එම ගිවිසුම අහෝසි කරන ලදී.ඒ සඳහා නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති නිසා තාවකාලිකව නතර කර ඇත. |
| | එලිහවුස් පාර්ක් පිහිනුම් තටාකය(විස්ට්වයික් පිහිනුම් තටාකය) | ප්‍රතිපාදන නොමැති වීම හා කොන්ත්‍රාත් ආයතනය හා උපදේශක ආයතනය වන කොළඹ මහ නගර සභාව සමග ඇති වූ ගැටළුකාරී තත්වයක් නිසා වැඩ නතර කර ඇත. |
| | කල්මුණේ සංධාන්ගණී ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය ඉදිකිරීම | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා දෙපාර්ශවයේ එකඟතාව මත ව්‍යාපෘතිය අත්හිටුවා තිබූ අතර ඉතිරි වැඩ සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2023.05.25 දින ව්‍යාපෘතිය නව කොන්ත්‍රාත්කරුවකු හට ප්‍රදානය කර ඇත. |
| | නැගෙනහිර පළාත් ක්‍රීඩා සංකීර්ණය | ත්‍රිකුණාමලය පළාත් ක්‍රීඩා සංකීර්ණය සම්බන්ධයෙන් 2022.07.30 දින පැවති නඩු වාරයේ දී ක්‍රීඩාපිටියේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අවසර ලබා දී ඇත.එම තීරණයේ පිටපත තවමත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. |

**3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | | නිර්දේශය |
|---|---|---|---|
| | **ව්‍යාපෘතිය** | **ප්‍රමාදයට හේතු** | |
| පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 6 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 530 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට වැයකර ඇති වියදම රු. මිලියන 315 ක් විය. අමුද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම හා ප්‍රතිපාදන සලසා ගැනීමේ දුෂ්කරතාවයන් හේතුවෙන් මෙම ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබුණු අතර ඒ අනුව මෙම ව්‍යාපෘති සඳහා මෙතෙක් වැයකර ඇති වියදමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගෙන නොතිබුණි. | විශාකා බාලිකා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය | මෙහි ඉතිරිවැඩ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ආයතනයක් තෝරාගෙන ව්‍යාපෘතිය 2023.04.26 දින ප්‍රදානය කල අතර මේ වන විට වැඩ අවසන් අදියරේ පවතී. | නියමිත වූ කාල පරිච්ඡේද තුල නිසි පරිදි කළමණාකරණය කර, අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| | ශාන්ත ජෝශප් විද්‍යාලයේ පිහිනුම් තටාකය | භෞතික ප්‍රගතිය 95%කි.Finishing Work අවසන් කර භාර ගැනීමට නියමිතව ඇත. | |
| | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩාපිටිය ඉදිකිරීම | ක්‍රීඩාපිටිය තණකොළ යොදා සකස් කර ඇත.ඉතිරිවැඩ ප්‍රතිපාදන නොමැති නිසා නතර කර ඇත.2024 වර්ෂයේ සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | |
| | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම | දෙපාර්ශවයේ එකඟතාව මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අත් හිටුවා ඇත.ඉතිරි වැඩ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවති | |
| | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ශක්ති වර්ධන ශාලාව ඉදිකිරීම | ප්‍රතිපාදන නොමැති නිසා හා රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් භාණ්ඩ වල මිලගණන් ඉහලයාම නිසා ව්‍යාපෘතිය අත්හිටුවීමට බලාපොරොත්තු වේ. | |
| | වව්නියා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම | ප්‍රතිපාදන නොමැති නිසා හා කොන්ත්‍රාත් ආයතනය බුන්වත් වීම (Bankrupt)හේතුවෙන් මෙම ඉදිකිරීම අත්හිටුවා ඇත.ඉතිරි වැඩ මෙම වසරේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | |

## 3.3 කාල පමාවකින් පසු ආරම්භ කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කල්මුණේ සන්ධාංගනි ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 155 ක්වූ බදු රහිත අගයකට 2019 වර්ෂයේදි ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2020 නොවැම්බර් 14 දින වන විට නිමකල යුතුව පැවති අතර 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 46 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් ඉදිකිරීම් පරිශ්‍රයට වෙනත් ක්‍රීඩාපිටි ඇතුලත්ව තිබුණු බැවින් ප්‍රදේශයේ ක්‍රීඩා සමිති මගින් බාධා ඇතිවීම හේතුවෙන් යාබද ඉඩමේ බිම් කොටසක් එකතු කර, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී 2021 මාර්තු 22 දින ආරම්භ කර තිබුණි.<br><br>2020 වර්ෂයේදි ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 31 ක් වූ (බදු මුදල් රහිත) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේදි එම අගයෙන් රු. මිලියන 14.6 ක් අය කර ගත යුතුව පැවතුණි. ව්‍යාපෘති කාලය 2022 මැයි 15 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර ගෙවන ලද අත්තිකාරම් මුදලට සරිලන සේ වැඩ කොටස් ඉටුකර භාරදීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. කොන්ත්‍රාත්තුවේ මිල උච්චාවචනයක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු එකඟ නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණ අතර ඉදීකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි. | කල්මුනේ සන්ධාංගනී ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරිමේ ව්‍යාපෘතිය රු.මිලියන 155 (වැ.ර) මුදලකට 2019.10.31 දින පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රු.31,045,976 (වැ.ර) අත්තිකාරම් මුදල් ගෙවා ඇත . අත්තිකාරම් අය කර ගැනීම සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම නිසා එම ආයතනය මඟින්ම ඉදිකිරීම් සිදු කරනු ලබන මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩාපිටිය ඉදිකිරිම සඳහා ඉදිරිපත් වූ අවසන් බිල මඟින් රු.14,802,243 ක මුදලක් කල්මුනේ සන්ධාංගනී ගෘහස්ත ක්‍රීඩාගාරය සඳහා අය කර ගැනීමට ඉතිරිව තිබූ අත්තිකාරම් මුදලින් අඩු කර ගැනීමට කටයුතු කර ඇත.ඒ අනුව රු.16,398,326 ක මුදලක් අත්තිකාරම් ලෙස අඩු කර ඇති අතර රු.14,647,650 ක අත්තිකාරම් මුදලක් අය කර ගැනීමට ඉතිරිව ඇත.<br><br>කොවිඩ් වසංගත කාලයට අදාලව මිල විචලනයන් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක මිල උච්චාවචනයක් සිදු වී ඇත. සියයට 10 ක මිල උච්චාවචනයක් පමණක් ලබා ගැනීමට කොන්ත්‍රාත් කරු එකඟ නොවන නිසා ව්‍යාපෘතිය අත්හිටුවීමට කටයුතු කල අතර නැවත කොන්ත්‍රාත් කරු විසින් ව්‍යාපෘතිය ආරම්භ කිරිමට එකඟ වී ඇති බව දන්වමි. | ආරම්භ කරන ලද ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නියමිත දිනට ඉදිකිරීම් සාර්ථකව නිමකළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වයඹ පලාත් ක්‍රීඩා සංකීර්ණයේ (බිංගිරිය) පිහිනුම් තටාකය ඉදිකිරීමේ කටයුතු රු. මිලියන 84.4 ක්වූ ( බදු රහිත) අගයකට 2017 ජනවාරි 03 දින පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත වසරක කාලයක් තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 91.6 ක් (බදු සහිත) කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.<br><br>2017 වර්ෂයේ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ අතර එම වර්ෂයේදි වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. මිලියන 16.9 ක් ගෙවා තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 16 ක් ගෙවිය යුතුව පැවතුණි. ව්‍යාපෘතියේ මිල විචලනයන් සඳහා 2023 මැයි 31 දින වන විටද අනුමැතිය ලබා ගෙන නොතිබුණ අතර පිහිනුම් තටාකයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණු බැවින් ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නො◌ාතිබුණි. | වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය ඉදිකිරිමේ ව්‍යාපෘතිය රු.84,399,475 ක මුදලකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර ඇත. ව්‍යාපෘතියේ මිලවිචලනයන් සියයට 10 ඉක්මවා සිදුව ඇති බැවින් ප්‍රසම්පාදන කමිටුව නිර්දේශයකින් අනුමැතිය ලබා ගැනීම සඳහා සුදුසු තාක්ෂණික ඇගයීම් කමිටුවක් 2023 අප්‍රේල් 04 දින පත්කර ඇත.තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරිම සඳහා සියළුම මිල විචලනයන් උපදේශක ආයතනය මඟින් අනුමත කර ලැබුණු පසු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි.අනුමැතිය ලබාගෙන අවසන් බිල්පත් ගෙවීමේදී ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නියමිත දිනට ඉදිකිරීම් සාර්ථකව නිම කිරීමට නිසි පරිදි කළමණාකරනය කිරීම හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 107 ක්වූ බදු රහිත අගයකට 2015 වර්ෂයේදි පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාලසීමාව මාස 09 ක් වන අතර 2016 මැයි 03 වන විට අදාළ ඉදිකිරීම නිම කල යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් මස 31 දිනට රු. මිලියන 61 ක් වැයකර පිහිනුම් තටාකයේ වැඩ නතර කර තිබුණි. මේ අනුව මෙම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරිම සඳහා රු.107,459,940.00 ක (වැ.ර) මුදලකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර ඇත.03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව හා කොන්ත්‍රාත් ආයතනය බුන්වත් වීම (Bankrupt)හේතුවෙන් මෙම ඉදිකිරිම අත්හිටුවා ඇති බව දන්වමි. | නියමිත සැලසුමකට ව්‍යාපෘති ආරම්කර විධිමත් පරිදි ව්‍යාපෘති කළමණාකරණය කර නියමිත දිනට නිම කල යුතුය. |
| **(ඇ)** | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරයේ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 53 ක් වු ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේදි පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාල සීමාව මාස 09 ක් වන අතර 2016 මැයි | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරිම සඳහා රු.53,139,423.00 ක (වැ.ර) මුදලකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර ඇත. 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය | නියමිත සැලසුමකට ව්‍යාපෘති ආරම්කර විධිමත් පරිදි ව්‍යාපෘති කළමණාකරණය කර නියමිත දිනට නිම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 03 දින වන විට ඉදිකිරීම කටයුතු නිම කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකරන භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබුණි. 2019 පෙබරවාරි 07 දින නැවත වැඩ ආරම්භ කිරීමට අවසර ලබාදී තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට මෙම ඉදිකිරීම උදෙසා රු. මිලියන 35 ක් වැය කර තිබුණි. අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් සීමා කිරීම, රටේ පවතින ආර්ථික තත්වය හා භාණ්ඩවල මිලගණන් ඉහලයාම හේතුවෙන් පිහිනුම් තටාකයේ වැඩ කොන්ත්‍රාත්කරු විසින් නතර කර තිබුණු අතර මේ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි. | අනුව හා රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් භාණ්ඩ වල මිලගණන් ඉහලයාම නිසා ව්‍යාපෘතිය නතර කර ඇත.වැඩ ආරම්භ කරන ලෙස කොන්ත්‍රාත් ආයතනය වෙත ලිපි මඟින් දන්වා ඇති අතර වැඩ ආරම්භ නොකරන්නේනම් ව්‍යාපෘතිය අත්හිටුවීමට කටයුතු කරන බව දන්වමි. | |
| **(ඉ)** | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 82 ක්වූ කොන්ත්‍රාත් වටිනාකමට 2015 වර්ෂයේදී ඉදිකිරීම් ආයතනයක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 09 ක් වන අතර ඒ අනුව 2016 මැයි 03 දින ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකරන භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබුණි. 2019 පෙබරවාරි 07 දින වැඩ ආරම්භ කිරීමට අවසර ලබා දී තිබුණ ද එම දිනයේ සිට වලංගු කාලය ඉක්මවා වසර 03 ක් ගත වුවද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 54 ක් වැයකර තිබුණද ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. | මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩාපිටිය ඉදිකිරිම සඳහා රු.81,877,205 ක (වැ.ර) මුදලකට පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර ඇත. 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව හා රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මීටර් 400 ධාවන පථය භාවිතයට ගතහැකි පරිදි සකස් කර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාරගෙන ඇත.ක්‍රීඩාපිටිය වටා වැට ඉදිකිරිමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන බව දන්වමි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යනයක් සිදුකර විධිමත් පරිදි ව්‍යාපෘති කළමණාකරණය කල යුතුය. |

### 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) අනුව ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එකී ක්‍රියාකාරී සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා සංගම් 66 කින් ක්‍රීඩා සංගම් 11 කින් පමණක් ක්‍රියාකාරී සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන තිබුණි. | 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දැනුවත් කිරීම් වැඩසටහනක් හා ලිපි මගින් ජාතික ක්‍රීඩා සංගම් දැනුවත් කර ඇති නමුත් ඔවුන් ඒ පිළිබඳ ප්‍රතිචාරයක් නොදැක්වීම නිසා මේ වනවිට ජාතික ක්‍රීඩා සංගම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීමේදී විගණනකය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර තිබේද යන්න පරීක්ෂාකර බැලීමටත් මේ සඳහා දත්ත සමුදායක් සකස් කරමින් පවතින බවත් කාරුණිකව දන්වමි. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා සියළු ක්‍රීඩා සංගම් නියාමනය කළයුතු වීම. |

### 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| 2018 මාර්තු 15 දින සිට 2018 මාර්තු 18 දින දක්වා මැලේසියාවේදී පවත්වනු ලැබූ 54 වන මයිලෝ පිහිනුම් ශූරතාවලියට දේශීය පාසැල් ක් හා ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් 195 ක් හා නිලධාරීන් 10 දෙනෙකු ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය විසින් සහභාගි කර තිබුණි.<br><br>මෙම තරගාවලියට සහභාගී වීමේදි ගුවන් ටිකට්පත්, යැපීම් හෝ වෙනත් වියදම් සඳහා ශිෂ්‍යයන්ගෙන් කිසිදු මුදලක් අය නොකර, අධ්‍යාපන අමාත්‍යාංශයේ කොන්දේසි වලට යටත්ව සවිස්තරාත්මක වාර්තාවක් ක්‍රීඩා අංශය වෙත ඉදිරිපත් කිරීම යන කොන්දේසිවලට යටත්ව පාසැල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 67 දෙනෙකු සහ ගුරුභවතුන් දෙදෙනෙකු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දී තිබුණි.<br><br>නමුත් මෙම තරඟාවලිය සඳහා සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 99 දෙනෙකුගෙන් ගුවන් ටිකට්පත්, නවාතැන්, යැපීම් හා වෙනත් වියදම් සඳහා රු. මිලියන 9 ක් අයකර ගෙන තිබූ අතර වැඩිපුර අයකර ගත් රු.108,717 ක් වූ මුදල ක්‍රීඩකයින් වෙත ආපසු ලබා දිමට කටයුතු කර නොතිබුණි.<br>තරගාවලිය සඳහා සංගමයේ පාලක මණ්ඩලය මඟින් අනුමත කරවා ගත | අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කළ කොන්දේසි පිළිබඳ එම අමාත්‍යාංශය විසින් පසු අධීක්ෂණය සිදු කළ යුතු අතර සහභාගි වන නිළධාරීන් ගැහැණු හා පිරිමි දරුවන් නොසලකා සියලුම දරුවන්ගේ වගකිම දැරිය යුතු වේ . රජයේ නිතිරිති හා රෙගුලාසි අනුගමනය කරමින් ප්‍රසම්පාදනය සිදු කරන ලෙස ජල ක්‍රීඩා සංගමය ඇතුළුව සියලුම සංගම් වෙත දැනුම් දිමට | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා සම්මේලනවල කටයුතු ප්‍රමාණවත් පරිදි නියාමනය හා පරිපාලනය කළ යුතු අතර, පරිපාලන, මුල්‍ය හා අනෙකුත් වැරදි හා වංචා වැළැක්වීම සඳහා නිතී,රීති, හා නියෝග හා චක්‍රලේඛ නිකුත් කිරීම තුලින් ප්‍රමාණවත් |

| | | |
|---|---|---|
| යුතු මුළු පිරිවැය ඇතුළත් කර විධිමත් අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර, එම තරඟාවලියට සහභාගී වීමට ක්‍රීඩකයින් 19 දෙනෙකුගෙන් අයකර ගත් රු. මිලියනයක් සඳහා ලදුපත් නිකුත් කර නොතිබුණි. මෙම තරගාවලිය සඳහා ජල ක්‍රීඩා සංගමය විසින් ගුවන් ටිකට් පත්, ආහාර හා ප්‍රවාහන වියදම් ඇතුළත් තරඟයේ සංවිධාන කටයුතු සඳහා පුද්ගලික ආයතනයක් තෝරා ගෙන රු.මිලියන 9.5 ක් ගෙවා ඇතත් ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි. | කටයුතු කරනු ලැබේ. තරඟයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණ පවත්වා ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දී ඇත. | අධීක්ෂණයක් හා මහපෙන්වීමක් සිදු කළ යුතු වීම. |

4. **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් ද, තෘතිය මට්ටමේ පුරප්පාඩු 12 ක්ද, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 62 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 20 ක්ද පැවතුණු අතර එය තුළ ඇතුළත් දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාර්යසාධනය සඳහා බෙහෙවින් බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සහ ක්‍රීඩා කටයුතු සම්බන්ධ කාර්යමණ්ඩලයේ තනතුරු 7 කට අදාළ පුරප්පාඩු 47 ක් පැවතුණි. | නව බඳවා ගැනීම නැවැත්වීම හා නිලධාරීන් සඳහා දේශීය, විදේශීය වශයෙන් වර්ෂ 5ක කාලයක් සඳහා නිවාඩු ලබාදීමේ වැඩපිළිවෙල හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පියවා ගැනීමට නොහැකිවී ඇත.මේ පිළිබඳව දිගින් දිගටම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර තිබුණද මේ වන තෙක් පුරප්පාඩු පුරවා ගැනීමට නොහැකිවී ඇත.එ බැවින් දෙපාර්තමේන්තුව සීමිත සේවක පිරිසකගෙන් කටයුතු පවත්වා ගන්න බව කාරුණිකව දන්වමි. | පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අනුගතව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජුවම බලපාන පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම. |